7)

මෙම වැකි වලින් වැරදි පණිවිඩයක් දෙන වැකිය,

1 එකක් සිතා අනෙකක් කීම ඉතාම අප්‍රසාදජනකය.

2 බොරුවක් හෙළ වු විට පළමු ප්‍රහාරය එල්ල වන්නේ,

3 කෙනෙකුගේ යහපත් පැවැත්ම "භාෂාව" නිසි ලෙස විශ්වාස්‍යත්වයි.

4 සන්නිවේදන කාර්යයේදී සදචාරවත් භාෂාවක් යොද ගැනිම අනිවාර්ය නොවේ.

8)
සමානාර්ථ පද පමණක් ඇතුළත් පද පේළිය.
1 රාත්‍රිය, රැය, සන්ධ්‍යාව, ප්‍රභාතය. 2. කුසලතා, හැකියා, ශක්‍යතා, අඛණ්ඩතා.
3 භාෂාව, බස, ශබ්දය, උච්චාරණය. 4. දිනකර, දිවයුරු, ඉර, සූර්යයා.

9)
"මහතෙල්" සුවඳමය - කුඩමසු පිළී ගඳ මය" යන කිවියෙන් අදහස් කරන්නේ,
1. මල් වල අසිරිය පිළිබඳවය. 2 මසුන් වල අසිරය පිළිබඳවය.
3. යහපත් - අයහපත් සියලු දෙසට වචනය මුල් වන බවය.
4. ජලය අපට ඉතා වැදගත් බව ය.

10)
වේදිකා නාට්‍යයක "පුරක" යන නමින් හඳුන්වන්නෙ
1 ප්‍රධාන නළුවා. 2 පොතේ ගුරු. 3. සංගීතය සපයන්නා. 4. ශාලාව අලංකෂර කරන්නා

11)
මුදු මොලොක මල මෙහේ
කුසඳරා බැති පෙමින් වේදනා විඳිමිනේ
අප ලොවට බිහි කෙරූ මෙසේ පවසන්නේ,
1 ජීවහත්ත. 2 දිසාල. 3 පුරක. 4. දඩයක්කරු.

12)
සඤ්ඤක අකුරු නිසි තැන යොදා ලයිවී ඇති නිවැරදි වාක්‍යය වන්නේ,
1 පුන් පෝද හඳ දුටු මගේ හද සතුටින් පිරුණි.
2. අබ ව්‍යංජනය පිසු අම්මා එය වඩාත් රසවත් කිරීමට අඹ ටිකක් යෙදුවා ය.
3 නුඹ ගැබ සිසාරා සියොත් කැළ ඉගිලෙන සැටි නුබ දුටුවෙහි ද ?
4 රජු තම අඟ මෙහෙසිය සමඟ උයනට පිවිසියේ උල් වූ අග ඇති ගවයන් බැඳ රථයකිනි.

13)
සඤ්ඤක අක්ෂර පිළිබඳන වැරැ අදහසක් දෙන වැකිය.
1 සඤ්ඤක අකුරු අර්ධ අනුනාසිකාක්ෂර නමින් ද හැඳින් වේ.
2. සිංහල හෝඩියේ සඤ්ඤක අක්ෂර නමින් ද හැඳින් වේ.
3 මේවා සෑදෙන්නේ ඞ, ඤ, ණ, න, ම යන නාසක්‍ය අක්ෂර ග,ජ, ඩ, ද, බ
යන අකුරු සමඟ පිළිවෙලින් එක්විමෙනි.
4 මෙහි "ඞ" අක්ෂරය බින්දුව සඳහා ද යෙදෙයි.

14)
නාට්‍ය රංගනයේ දී නොකළ යුතු කරුණු වන්නේ,
1 අවශ්‍ය තැන හඬ පාලනය.
2 දෙබස් කථන විලාසයෙන් පැවසීම.
3. උචිත තැන්වල අභිනය.
4 දෙබස් හා ගීත කට පාඩම් නොකර හඬ පටයක් ඒ සඳහා භාවිත කිරීම.

15)
මේවා අකුරෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
1 නාම පදයක ප්‍රකෘතියේ "ල" කාර දෙකක් ඇති විට බොහෝ විට මුල් ශබ්දය මූර්ධජ "ළ" වේ.
2. ස්ථානවාචී "පොළ" යන්න මූර්ධජ "ළ" කාරය සහිතව යෙදේ.
3 ළපටි, ළා යන අදහස ඇති වචනවල මූර්ධජ "ළ" මුලට යෙදේ.
4 සමුහයක් හැඟවීමේදී එම පදවල අගට "ළ" නොයෙ දේ.

16)
හිස්තැන් වලට සුදුසු අක්ෂර පිළිවෙලින්
1. ණ, න, ළ, ල. 2 න, ණ, ල, ළ. 3 ණ, ළ, ල, න 4. ණ, ල, ළ, න

17)
අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොහගී හිඟා කෑම බැරි වුණු තැන ලගී ගයා මර ගී මෙම ප්‍රකාශය කරනු ලැබුවේ.
1 මාර්ටින් වික්‍රමසිංහ මහතා.
2. කුමාරතුංග මුනිදාස මහතා.
3. ධර්මරත්න ගමගේ මහතා.
4. හෙන්රි ජයසේන මහතා.

18)
සුමන සමන් දිව්‍යරාජයාගේ අඩවිය නමින් හඳුන්වන නගරය,
1. මහනුවර. 2 දඹදෙණිය.
3. රත්නපුරය. 4 පොළොන්නරුව.

19)
මැණික් කර්මාන්තයට අදාළ නොවන පදය වන්නේ,
1. හණ පෝරුව. 2 . දිමි ඇස.
3. සක පෝරුව. 4 ගඟ ඇදීම.

20) පහත සඳහන් යෙදුම් අතරින් "රූඪි" පදයක් නොවන්නේ,
1 ඉහේ මලක් පිපුණා. 2. සායම ගියා.
3. වක්කඩේ හකුරු හැංගුවා වගේ. 4. කනෙන් රිංගුවා

(ලකුණු 2 x 20 = 40)

---

**ii** කොටස

ඔබ පාසලේ පැවැත් වූ "කුමාරතුංග මුනිදාස" අනුස්මරණ දිනය" නිමිති කොට පවත්වන ලද උත්සවය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. "කුමාරතුංග මුනිදාස අනුස්මරණ දිනය" යෙදී ඇත්තේ කවරදාට ද?

2. ඔබ පාසලේ ප්‍රධාව අමුත්තා වශයෙන් පැමිනියේ කුමාරතුංග මුනිදාස සුරින් ගේ මුණුබුරෙකි.කුමාරතුංග පරපුරෙන් පාවත එන ඔහු කව්ද?

3. එදින පැවති උත්සවයේ දී ඔබගේ සිත් ගත් එක් අංගයක් පිළිබඳවත් එයට හේතුවක් දක්වමින් වැකි දෙකක් ලියන්න.

4 හොඳ දේ සිතන ,සිතූ දේ කියන , කී දේ කරන උදාර දරුවාගේ නම කුමක්ද?

5 මාතර දික්වැල්ලේ වැවුරුකන්නල සිංහල සමිතිය මගින් කරන ලද උතුම් කාර්යය කුමක්ද?

6 සිංහල භාෂාව නිවැරදිව ඉගෙනීම හා උච්චාරණය පිළිබඳව පන්ති කාමරය තුළ ළමුන්ට අමතරව සතුන් යොදා ගනිමින්, කුමරතුගුවන් නිර්මාණය කළ කෘතිය ඇසුරින් එදින වේදිකා ගත වූ නාට්‍යයේ නම ලියන්න.

7. කුමරතුගු මුනදස් පඩිතුමා රචනා කළ ළමා කෘති දෙකක් නම් කරන්න.

8 කුමාරතුංග මුනිදස වියතාණන් රචනා කළමේ කවි පෙළ කියවාඅසා ඇති ප්‍රශ්න දෙකට පිළිතරු ලියන්න.

නුවණට වැඩි දෙයක් - කිසි තැනෙක නැති බව දැන
කරනු තැන් එය ලැබුමට - තමා බල ඇති පමණින්
නුවණැතියන් සිටින - සබාවට පැමිණි කල
නුවණ නැත්තෝ විළියෙන් - පසුබා සිටිත් කරබා
නුවණැත්තො ඒ ලෙස - නොසිටියත් කිසි සබාවෙක
රජුහටත් නො ලැබිය හැකි - ගුරු බුහුමන් ලබත් මැයි.
හොඳ නරක දැනුමෙත් - නො ලැබේ නුවණ නැත හොත්
ඒ හෙයින් හොඳ ය සලකා - කරන දෙය ද නොහොඳ වේ

1 මෙහි සඳහන් ආකාරයට තම ශක්ති ප්‍රමාණයෙන් උත්සය කළ යුත්තේ කුමක් ලබා ගැනීමටද?

2 විළියෙන් පසුබා සිටින්නෝ කවරහුද?
3 රජුනටත් නොලැබෙන බුහුමන් ලබන්නෝ කවරහුද?
4. නුවණ ලබා නොගත් අයගේ ලක්ෂණය කුමක්ද?

2)
ඔබ පියෙකි - සොහොහුරෙකි
මහ බලැති - එක හිතකි
අහසේ දෙව් රුවකි
**<u>මට මගේ රට ලබා දුන් ආදරණයී රණවිරුවාණෙනි</u>**

හිරුට හොරා පිබිදී ගොවිපලට ඇදෙනවා
සඳුට සිනා සී කුඹුරෙන් ගොඩ වී එනවා
පායන හිරු සඳුට ලැදිව දිවි සැරසෙනවා
මුහුදේ හිරු නාන කලට අඟ සෝදනවා
**<u>ගොවියා දැයට බත සපයන දෙවියා ය.</u>**

නිල කොබෙයි රැන ඇදී
වී අහුලන ඉපනැල්ලේ
මාල ගිරව් පේළි සැදිලා
නව අවුරුදු ගීත ගයනවා
**<u>අලුත් අවුරුද්ද ඇවිත්</u>**

දුටුවන් මන නුවන් බඳනා , නීල කරදිය වළල්ලෙන් වටවූ **<u>පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය</u>**
_ මා උපන් දේශයයි.
රත් නුවන් අහසට බමන්නිය - රත් මලින් සියොළත සදන්නිය
රත් දළින් නරයන් බුදන්නිය - නොදන්නෝ කවුරු කුවෙණි රුදුරූ
කවුරුන් කෙසේ කීවද , අපේ අම්මා අපට උතුම්ය සෙනෙවන්නය. **<u>අප මැණියන් එනතුරු බලා සිටින්නෙමු</u>**

ඉහත සඳහන් ගීත බණ්ඩි හා යෙදුම් ඇසුරු කර ගනිමින් වචන එකසිය පනහක පමණ රචනයක් ලියන්න. ඉරි ඇදි වැකි මාතෘකාව ලෙස යොදන්න. ( අත් අකුරු, නිවැරදි අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත පිළිබඳව සැලකිලිමත් වන්න.)

(ලකුණු 14) 3)

03

මෙම ගීතයේ ඇති මහප්‍රාණ දහය අකුරෙන් අටක් සොයා යටින් ඉරක් අඳින්න.

දන මන නයන වශීකළ ලංකා ශාන්ත සුබදායි
ජන්ම භූමි ධරණී
මධුකර භෘංග සමුය විභූෂිත විකසිත පුෂ්ප කලාප සුගන්ධිත
මනෝහාර ගිරි ඇති ශිඛර අලංකෘත පූණ්‍ය භූමි ධරණී.

සුදුසු යුගල පද පහත සඳහන් වරහන් තුළ ඇති හිස්තැනෙහි ලියන්න

1. ......................................... ඇති පවුලක එකම දරුවා වූ ප්‍රශාන්
2. .................................. කෑමට රුසියෙකි
3. .................................. වල
4. ................................. කියා දීමට වත් ඔවුන්ගේ දෙමාපියන්ට වේලාවක් නැත .ක්ෂණික ආහාර ගැනීම නිසා නිතර
5. ................................... වලට ද ඔහු ගොදුරු වේ.දිනක් වෛද්‍යවරයකු හමුවීමට ගිය අවස්ථාවේ ප්‍රශාන්ගේ දෙමාපයින්ට ඔහු පැවසුවේ කොතරම්
6. ......................................... රැගෙන දුන්නද, එයට වඩා දරුවාගේ
7...................................... සොයා බැලීමත
8. ................................ කියා දීමත් දෙමාපයින් විසින් අතපසු නොකළ යුතුය.

**(හොඳ නරක, බඩු මුට්ටු ,මිල මුදල්, අනම් මනම්, ආහාර පාන, ලෙඩ රෝග, ගුණ අගුණ, දුක සැප)**

අවශ්‍ය තැන්වල නිවැරදිව විරාම ලක්ෂණ යොදන්න.

1. ඖෂධ දෙවර්ගය 5.4 අනුපාතයට මිශ්‍ර කරන ලෙස වෙද මහතා නියෝග කළේය.
2. මහවැලි ,කැළණි, කළු වලවේ යන නම් වලින් හඳුන්වන්නේ සමනොල සිරස මුදුනින් ඇරඹෙන සිව් මහා ගංගා ය. (ලකුණු 2)

4) පහත සඳහන් කියමන් නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ සටහන් කරන්න.

1. නූතන සිංහල වර්ණ මාලාවේ ඇති අක්ෂර ගණන හැටකි. :.(..........)
2. දුරාතීතයේ පටන් ලෝක පුදුම හත තෝරා ගැනීමට අන්තර්ජාලය හා දුරකථන මගින් ලෝක ජනමත විමසුමක්කර ඇත. : .(..........)
3. කුමාරතුංග මුනිදාස වියතාණන් මෙලොවට බිහිවූ කාලයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය තුළ විශාල පසුබෑමක් තිබුණි. : .(..........)
4. එක් දහස් නවසිය හතළිස් අටේ පෙබරවාරි හතර වන දින ශ්‍රී ලංකාව සියළු පර සතුරු ආක්‍රමණ වලින් මිදුණු ස්වාධීන රටක් බවට පත් විය. :.(..........)
5. අප විසින් දුරදිග නොබලා කරන , සදාචාරයට පටහැනි සමහර වාගාලාපයන් සමාජයේ ගැටුම් නිර්මාණය කිරිමට හේතු වේ. :. (..........)

(ලකුණු 1 x 5 = 5)

හිස්තැන් වලට සුදුසු උක්ත පද හා ආඛ්‍යාත පද යොදන්න.

1. ආදි කොලොම්බියානු ශිෂ්ටාචාරයට අයත් මයන්වරු විමෙන් ඉටිසා පූජනීය නගරය නිර්මාණය ......................................................
2. .................................................. පොඩිනා සමඟ ගං ඉවුරට ගියාය.
3. .................................................. ගිරවකු සේ වචන හසුරුවයි.
4. කියවීමෙන් ළමුන්ට ජීවිතාවබෝධය ලබා ගත හැකි බව වියතණෝ .........................................
5. මම සෙමෙන් සෙමෙන් අම්මා සමඟ පතල් පොළට ..........................................

(ලකුණු 2 ෲ 20 = 40)

5)
මෙහි සඳහන් ලෝකයේ පුදුම හත පිහිටි රටවල් ඉදිරියෙන් ලියන්න.

1 ක්‍රිස්තුන් වහන්සේ ගේ ප්‍රතිමාව - ..............................................................
2 ටජ් මහල් මන්දිරය - ..............................................................
3. පෙට්‍රා නගරය - ..............................................................
4 කොලෝසියම - ..............................................................
5. චිචෙන් ඉට්සා පුජනීය නගරය - ..............................................................
6 මාචු පීචු බලකොටුව - ..............................................................
7. චීන මහා ප්‍රාකාරය - ..............................................................

(ලකුණු 7)

,, ඔබගේ පෙළපොතෙයි එන ˝ පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
˝ මේ බලනවා තමුසෙගෙ කල්පනාවේ හැටියට මට වයස කීයක් ඇද්ද? ˝

1 මෙසේ පැවසුවේ කව්ද? 2. කාහට ද ? 3 . ඔහු විසින් දුන් පිළිතුර කුමක්ද?

(ලකුණු 3)

6)
පහත සඳහන් පදවලින් හැඟවෙන විවිධ අර්ථ දෙක බැගින් ලියන්න.(පිළිතුරු තෝරා ගන්න)

1 සඳ - .............................. ..............................
2. දද - .............................. ..............................
3 නා - .............................. ..............................

(ලකුණු 3)

* මේවාට සමාන අරුත ඇති තනි පදය තෝරා ඉදිරියෙන් ලියන්න .

1 අනුව යාම - ....................................
2 බලාපොරොත්තු නොවු - ....................................
3 අවස්ථාවට ගැලපෙන - ....................................
4. උපතින්ම උරුම වු - ....................................

( නිසග , සංකීර්න , අවස්තාවෝචිත , අතිශය , අනාපේෂිත , අනුකරණය ) (ලකුණු 3)

* මෙම පදවලට විරුද්ධාර්ථ දෙන පද ලියන්න
. 1. අනාත්ම - ....................................
2. සරල - ....................................
3 අනායාසයෙන් - ....................................
4 දුරාචාරය - ....................................

(ලකුණු 3)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය 2021 | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை 2021 | 02 மணி நேரம் |
| Diagnostic Test 2021 | 02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 08 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 08 |
| Sinhala Language and Literature | Grade 08 |

විභාග අංකය .......................................................

**I** කොටස

- පළමුවන කොටසට අයත් සියලුම ප්‍රශ්න සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු ලියන්න.
- I පත්‍රයට අදාළ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

01. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තොරා යටින් ඉරක් අඳින්න.

i. සමස්ත ii. වාර්ථා iii. විශිෂ්ඨ iv. පුස්ථකාලය

02. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තොරා යටින් ඉරක් අඳින්න.

i. ශ්‍රේනිය ii. විශේශණ iii. ප්‍රශ්ණ iv. විමර්ශන

03. රාත්‍රිය නැමැති පද්‍ය පන්තිය රචනා කළේ

i. මහගම සෙකර ii. ගුණදාස අමරසේකර iii. වැලිවිට සෝරත හිමි iv. ඇස්. මහින්ද හිමි

04. ප්‍රාදේශිය මහලේකම්. කළමනාකරු, ස්ථානාධිපති යන තනතුරු පිළිවෙළින් අයත් වන ආයතන වන්නේ

i. ලේකම් කාර්යාලය, බැංකුව, තැපැල් කාර්යාලය

ii. තැපැල් කාර්යාලය, බැංකුව, ලේකම් කාර්යාලය

iii. ලේකම් කාර්යාලය, තැපැල් කාර්යාලය, බැංකුව

iv. බැංකුව, තැපැල් කාර්යාලය, ලේකම් කාර්යාලය

05. ගුරු ශිෂ්‍ය සබඳතාව වඩාත් වැදගත් වන්නේ

i. පන්සලට ii. පාසලට iii. නිවසට iv. රෝහලට

06. සමාජ සම්බන්ධතාව අනුව ඥාති සම්බනධතාවක් ගැන නොකියවෙන්නේ

i. තාත්තා ii. මාමා iii. මහත්තයා iv. පුතා

**පහත සඳහන් අර්ථයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරා යටින් ඉරක් අඳින්න.**

07. බොරු සෙනෙහසක් පෙන්වීම

i. කුකුළු නින්ද

ii. බක තපස් රැකීම

iii. කිඹුල් කඳුළු හෙළීම

iv. ජාඩියට මූඩිය වගේ

08. අකාරාදි පිළිවෙළට යෙදී ඇති වරණය තොරන්න.

i. කොළඹ, කඩවත, කතරගම, කෑගල්ල

ii. අමාවතුර, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ

iii. ඉංග්‍රීසි, සිංහල, ගණිතය, ඉතිහාසය

iv. කහපාට, නිල්පාට, රතුපාට, සුදුපාට

**පහත සඳහන් තනතුරු නාමය අයත් වන රාජ්‍ය ආයතනයක් නොවන්නේ**

09. ස්ථානාධිපති තුමා

i. පොලිසිය ii. තැපැල් කන්තෝරුව iii. ලේකම් කාර්යාලය iv. දුම්රිය ස්ථානය

10. සභාපති තුමා

i. ඉංජිනේරු කාර්යාලය ii. ප්‍රාදේශීය සභාව

iii. මරණාධාර සමිතිය iv. පාසල් සංවර්ධන සමිතිය

**මුලින් දී ඇති බහු අර්ථ පදයට අයත් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න**

11. දදය - i. කොඩිය ii. කුෂ්ඨය iii. අඟෝාන iv. මුහුණ

12. සඳ - i. ඡත්‍රය ii. චන්ද්‍රයා iii. උතුම් iv. සන්ධිය

13. ගුණ නාම යන්නට උදාහරණයක් වන්නේ,

i. නරඹන ii. සාමාජික iii. නාගරික iv. මහලු

14. වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව පැවතියේ සාකච්ඡා වාරයයි. සමිතියක වාර්තාව සභාවට ඉදිරිපත් කරනු ලබන්නේ,

i. සභාපති තුමා විසනි ii. භාණ්ඩාගාරික තුමා විසිනි

iii. ලේකම් තුමා විසිනි iv. සංවිධායක තුමා විසිනි

15. වැසි වසිනා අහස අපි යන ගීතය රචනා කළේ

i. ඩබ්.ඩී. අමරදේව මහතා ය.   ii. මහගමසේකර මහතා ය.

iii. ගුණදාස අමරසේකර මහතා ය.   iv. මාටින් වික්‍රමසිංහ මහතා ය.

16. ගී ගයන්නීය යන පදය

i. වර්තමාන පුරුෂ ලිංග පදයකි   ii. අනාගත ස්ත්‍රී ලිංග පදයකි

iii. වර්තමාන ස්ත්‍රී ලිංග පදයකි   iv. අතීත පුරුෂ ලිංග පදයකි

17. අපේ ගම නවකතාව රචනා කරන ලද්දේ

i. මාර්ටින් වික්‍රමසිංහ මහතා විසිනි   ii. ඩබ්. ඒ. සිල්වා මහතා විසිනි

iii. ගුණදාස අමරසේකර මහතා විසිනි   iv. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

18. 'බරණැස් පුරයට යෙහෙන් පැමිණ දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරනු මැනවි', මෙහි කරනු මැනවි යන පදය

i. පූර්ව ක්‍රියාවකි   ii. මිශ්‍ර ක්‍රියාවකි

iii. විධි ක්‍රියාවකි   iv. ආශිර්වාද ක්‍රියාවකි

19. කලත්‍ර පරිග්‍රහය යන්නෙහි අර්ථය වන්නේ

i. ස්වාමි භාර්යා සබඳතා   ii. භාර්යාවක පාවා ගැනීම

iii. කාලයාගේ ඇවෑමෙන්   iv. ඉමහත් පරිශ්‍රමයෙන්

20. අනුක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

i. නිලධාරීහු   ii. ළමයෙකු   iii. කාන්තාව   iv. මම

(2×20=40)

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න ඇතුළත්වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ඔබ පන්ති කාමරයේ සිදුකළ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ ඉගෙන ගත් ප්‍රායෝගික ලේඛන වර්ග 02ක් නම් කරන්න.
II. ඒවායේ ඇති ප්‍රයෝජන 02ක් ලියන්න.
III. මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී ගුරුතුමිය/ගුරුතුමා ලබා දුන් උපදෙස් 02ක් ලියන්න.
IV. ප්‍රායෝගික ලේඛනයක් ලෙස දැන්වීම් පත්‍රිකාවක් යොදා ගත හැකි අවස්ථා 02 ක් නම් කරන්න.
V. දැන්වීම් පත්‍රිකාවක ඇතුළත් විය යුතු ලක්ෂණ 03ක් ලියන්න.

(ලකුණු 15)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150ට නො අඩු රචනාවක් ලියන්න.

I. ළමා අයිතිවාසිකම් සුරකිමු.

II. ලෝකෙන් උතුම් රට ලංකාවයි.

III. මා කැමති ලේඛකයා

IV. සුන්දර රාත්‍රියක අසිරිය

නැතහොත්

V. සිරිමල් දක්ෂ දරුවෙකි. ඉගෙන ගැනීමට මෙන් ම ක්‍රීඩාව හා සංගීතයට ද පුදුම හපන්කම් පෙන්වයි. දුප්පත් පවුලක විවිධ අඟහිඟකම් මැද උත්සාහයෙන් කටයුතු කරන ඔහු ජීවිතයේ අභියෝග ජය ගෙන කීර්තිමත් පුද්ගලයෙකු බවට පත් විය.......... මේ කොටස ඉවහල් කර ගෙන කතාවක් ගොඩනගන්න.

(ලකුණු 15)

03. (අ) "උඹේ මේ කෙහෙම්මල් හවරිය හන්දා මගේ හේනේ කුඹුරේ වැඩත් පාළු වුණා"

1. මෙම කොටස ඇතුළත් පාඩමේ නම ලියන්න.

2. මෙසේ ප්‍රකාශය කළේ කව්රුන් විසින් කාහටද?

(ආ) "ඉඳ ඉක්මනට කඩේට ගිහිල්ලා නූල් රෝල් දෙකක් අරගෙන වරෙන්"

1. මෙසේ ප්‍රකාශ කළේ කවු ද?

2. මෙම ප්‍රකාශය කළේ කාට ද?

(ඇ) "මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වන පෙත තුළයි"

1. මෙම පාඨය ඇතුළත් පාඩම ලියන්න.

2. මෙම පාඩම ඇතුළත් කතාව නම් කරන්න.

(ඈ) "ගොවියෝ අපි කම්කරුවෝ

රට රකිනා ජනතාවෝ"

1. ඉහත සඳහන් ගී ඛණ්ඩය ඇතුළත් ගීතය රචනා කළේ කවු ද?

2. එම ගීතය ගායනා කරන්නේ කවුරුන් විසින් ද?

(ඉ) "වැද්දන් ආපසු එති'යි මම නොසිතමි සොඳුර, එහෙත්, ආවත් ඔබට අනතුරක් වන්නට ඉඩ නොදෙමි"

1. මෙම පාඨය ඇතුළත් නාට්‍යය කුමක් ද?

2. මෙහි සොඳුර යන්නෙන් අමතන්නේ කාට ද?

(ලකුණු 10)

04. පහත වරහන් තුළ දී ඇති වචන **ජාති නාම, ද්‍රව්‍ය නාම, ගුණ නාම, සංඥා නාම** වශයෙන් වගු ගත කර බෙදා දක්වන්න.
(හංසයා, වැලි, ලංකාව, රටකජු, උස, කෙට්ටු, දිනමිණ, වතුර, පොත්, ඕලු ,මුගුණුවැන්න, ගල්, කරුණාවන්ත, දක්ෂ ,කුරුල්ලා, පැන්සල, මහලු, සම්පත් ,ගුත්තිලය, සබරගමුව)

(ලකුණු 10)

05. සුදුසු උක්ත පද හෝ ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.

1. ගොවියා සී සෑමට ගවයන් දක්කාගෙන .....................................
2. රජවරු ධාර්මිකව රට පාලනය ....................................
3. කුමාරතුංග මුනිදාස සූරිහු සාහිත්‍යයට මහ මෙහෙවරක් .......................................
4. ................................. පලතුරු අලෙවි කළාය.
5. ..................................... ගෘහ භාණ්ඩ සාදයි.
6. ................................. සරුංගලයක් සාදයි.
7. ...................................... ගීත නාද කළෝ ය.
8. තාරකාව අහසේ දීප්තිමත් ව ...........................................
9. තොපි පන්තිය පිරිසිදු ...................................
10. .................................... මිතුරන්ට ලිපියක් ලියන්නෙමු.

(ලකුණු 10)

06. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දීඝලම්භික නම් නුවර වසන බමුණෝ දෙන්නෙක් ශාසනයෙන් පිටත මහණව අටසාළිස් අවුරුද්දක් තපස් කළෝ ය. උන් දෙන්නා ගෙන් එක් කෙනෙක් කලත්‍ර පරිග්‍රහය නැති කලට අපගේ කුල පරම්පරාව නසී'යි සිතා තමා රැකි තපස් අනුන්ට විකුට දෝ හෙවත් එහි පින් දී ගෙරි සියයකුත් පාද පරිචාරිකා කෙනෙකුන් ලදින් පුත්‍ර ප්‍රතිලාභය තකා කලත්‍ර පරිග්‍රහ කළෝ ය.

1. මේ දීඝායු කුමාරයාගේ කතා පුවත ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.
2. පහත සඳහන් පදවල තේරුම ලියන්න.
   (අ) අටසාළිස් අවුරුද්දක්
   (ආ) පාද පරිචාරිකා
3. මෙම ඡේදයේ සඳහන් ලාභය කුමක් ද?
4. මෙහි සඳහන් 100 (සියය) ඒවා කීයද? ඒ මොනවා ද?
5. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචන දෙකක් මෙම ඡේදයෙන් උපුටා දක්වන්න.

**<u>1 කොටස</u>**

- **පළමු කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- පහත එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අනුන්ගේ දියුණුවට <u>අකුල් හෙළීම</u> නොකළ යුතු බව ගුරුතුමා පැවසුවේය.

a) නින්දා කිරීම  
b) බාධා කිරීම  
c) අඩුවම දීම  
d) ඊර්ෂ්‍යා කිරීම

(02) තමා කළ සොරකම හෙළිවීම නිසා ජිනදාසට <u>හීන් දාඩිය</u> දැම්මේය.

a) කණගාටුවක් ඇතිවිය  
b) ලැජ්ජාවක් ඇතිවිය  
c) බියක් ඇතිවිය  
d) වෙහෙසක් ඇති විය

(03) නිවැරදි අක්ෂර වින්‍යාසයක් සහිත පිළිතුර තෝරන්න.

a) නවීකරනය - නිෂ්පාදනය  
b) මර්ධනය - ප්‍රදර්ශණය  
c) සීග්‍රගාමී - නිර්මානය  
d) නිරීක්ෂණය - විශිෂ්ට

(04) මහප්‍රාණ අක්ෂර දෙකක් ඇති පිළිතුර තෝරන්න.

a) භාණ්ඩාගාරය  
b) සර්ෂණය  
c) අධිෂ්ඨානය  
d) නිෂ්ඵල

(05) සඤ්ඤක අක්ෂර පමණක් ඇති වචන යුගලය තෝරන්න

a) නුවණ - පහළ  
b) තඹර - කරඬුව  
c) ඥාණය - දහනය  
d) සංයුතිය - පරිමාව

(06) පහත සඳහන් යුගල පද අතරින් මුල් පදයට විරුද්ධාර්ථය දෙන පිළිතුර තෝරන්න.

a) චාරිත්‍ර වාරිත්‍ර  
b) සැප සනීප  
c) වතගොත  
d) මුදල් හදල්

(07) මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථය දෙන පිළිතුර තෝරන්න.

a) සමෘද්ධිය - පරිහානිය  
b) ප්‍රණාමය - ගෞරවය  
c) සාමාන්‍ය - තියුණු  
d) අවධානය - අවබෝධය

(08) මුලින් දී ඇති පදයේ සමානාර්ථ පද පමණක් ඇති පද පේළිය තෝරන්න.

a) රත්න - රුවන් , පහන , අරන්  
b) දිය - ලෝකය , ජය , දද  
c) ගත - වැර , පොත , මුහුණ  
d) සාගරය - සමුද්‍රය, සිඳු , සයුර

(09) සමූහාර්ථවාචී පදයකට අයත් නො වන පදයකි.

a) මුළ  
b) කැල  
c) වල  
d) පෙළ

(10) අකාරාදි පිලිවලට නම් යොදා ඇති පිළිතුර තෝරන්න.

a) ඕෂධී, ඉරේෂා, නයෝමි, තරුෂි  
b) ආලෝකා, එරන්දි, කසුනි, ගයනි  
c) ගයාන්, අශෝක, කවිඳු, ඉඳුවර  
d) තරිඳු, කමල්, මධුර, චමිල්

(11) ප්‍රථම පුරුෂ බහුවචන නාමපදය තෝරන්න.

a) නුඹලා
b) කුරුල්ලෝ
c) අපි
d) හෙතෙම

(12) අනුක්ත බහු වචන නාම පදයක් සහිත පිළිතුර වන්නේ,

a) ගායකයා
b) ඔවුහු
c) සමහරු
d) ගුරුවරුන්

(13) උපමාවාචී නිපාත ගණයට අයත් නො වන පදය තෝරන්න,

a) උදෙසා
b) වගේ
c) බඳු
d) වැනි

- පහත සඳහන් එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(14) රවීන්ද්‍රනාත් තාගෝර් තුමාට නොබෙල් ත්‍යාගය හිමිවූ සාහිත්‍යය නිර්මාණය ............. කාව්‍යයයි

a) මානසී
b) ගීතාංජලී
c) සන්ධ්‍යා සංගීත්
d) නෛවේද්‍ය

(15) හත්මුතු පරම්පරාවේ අන්තිමයා ................ නමින් හැඳින්වේ.

a) පනත්තා
b) කිත්තා
c) කිරිකිත්තා
d) කිරිකැමුත්තා

(16) කාව්‍ය සාහිත්‍යාදී කලාවන් රසවිඳීමෙන් සෞම්‍ය වූ හදවතක් ඇත්තා ............. නමින් හැඳින්වේ.

a) ශ්‍රාවකයා
b) සහෘදයා
c) පාඨකයා
d) කවියා

(17) කාව්‍ය නිර්මාණයක් වින්දනයෙන් සිතෙහි හටගන්නා අපූරුව හැඟීම ................ නම් වේ.

a) චමත්කාරය
b) කුතුහලය
c) ප්‍රතිභාව
d) සංකල්ප

(18) පහත දක්වා ඇති සම්ප්‍රදායික යෙදුම් අතරින් ආප්තෝපදේශයක් ඇතුලත් පිළිතුර තෝරන්න.

a) දොළොස් මහේ පහන වගේ
b) කුනිස්සන්ට දැල් දානවා
c) පනින්නට පෙර සිතා බලන්න
d) ඉහේ මලක් පිපුණා

- 19 හා 20 හි ඇති වාක්‍ය අතරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

(19) a) නුඹලා චාරිකාවක් ගියෙහු.
b) තාරකා අහසේ බබළති.
c) ශිෂ්‍යයන් හොඳින් ඉගෙන ගනිති.
d) අක්කා වැඩට ගියේය.

(20) a) අපි ශ්‍රමදානය ට සහභාගි වන්නේ ය.
b) සමහරෙක් අවංකව කටයුතු කරයි.
c) ගායකයෝ රසිකයෝ පිනවති.
d) තෙරණුවෝ දහම් දෙසති.

**(ලකුණු 2 × 20 = 40)**

## 2 කොටස

- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යවේ 3, 4, 5, 6, 7 යන ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.

(01) ජනකතා පිළිබඳව ඔබ සකස් කළ පොත් පිංච ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1) ඔබ සකස් කළ පොත් පිංච සඳහා කරුණු සොයා ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල.02)
2) පොත්පිංච නිර්මාණය සඳහා උපදෙස් ලබා ගත් එක් අයකු නම් කරන්න. (ල.01)
3) ඔබේ පොත් පිංච නිර්මාණශීලීව සකස් කිරීමට යොදාගත් ක්‍රම දෙකක් ලියන්න. (ල.04)
4) පොත්පිංච ට ඇතුළත් කළ ජනකතා දෙකක් නම් කරන්න. (ල.04)
5) එය සකස් කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටලුවක් ලියන්න. (ල.01)
6) මෙම නිර්මාණය සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.04)

**(මුළු ලකුණු 16)**

(02) පහත සඳහන් මාතෘකා වලින් එකක් යටතේ වචන 150 ක පමණ රචනා ලියන්න.

1) වැඩිහිටියන්ට සැලකීමේ අගය.
2) පුස්තකාලය අධ්‍යාපනයට උදව් කර ගැනීමේ වැදගත්කම.
3) අපේ ජාතික වීරවරයෝ.
4) ජල සම්පත රැකගනිමු.
5) පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේදී දක්ෂතම ශිෂ්‍යයාට හිමි තියාගය ඔබට ලැබුණ බව දැනගත් මොහොතේ ඔබට ඇතිවූ හැඟීම විස්තර කරන්න.

**(ලකුණු 14)**

(03) ඔබ ප්‍රදේශයේ දිනෙන් දින වැඩිවන අපරාද හා සොරකම් වළක්වා දෙන ලෙස ඉල්ලමින් පොලිස් ස්ථානාධිපතිතුමාට යැවීමට සුදුසු ලිපිය ලියන්න.

නැතහොත්

ඔබේ ප්‍රදේශයේ පැතිර පවතින ඩෙංගු උවදුර පිළිබඳව මහජන සෞඛ්‍ය නිලධාරිතුමා සමඟ පාසලේ විදුහල්පතිතුමා කරන කතාබහ ඇසුරෙන් සංවාදයක් ලියන්න.

**(ලකුණු 10)**

(04) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(1) "මේ ඇවිල්ලා ඉන්නේ නැතිවුණ දෙයක් ගැන අහන්නයි"

a) එම ප්‍රකාශය කළේ කවුරුන් විසින්ද?
b) ප්‍රකාශය කළේ කාහටද?
c) නැති වී ඇත්තේ කුමක්ද?
d) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ලකුණු $1 \times 4 = 4$)

(2) "නොයෙක් නරක වැඩ හාමුදුරුවනේ ඔය පෙත්සම් ඔක්කොම ලියලා තියෙනවා"

a) නව ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය ග්‍රන්ථය කුමක්ද?
b) එහි කතුවරයා කවුරුන්ද?
c) හාමුදුරුවනේ යනුවෙන් හැඳින්වූයේ කාහටද?

(ලකුණු $1 \times 3 = 3$)

(3) "හෙට එක්ක කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුලුවන්ද?"

a) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින්ද?

b) මෙම ප්‍රකාශය කළේ කාහටද?

c) කැකිරාවට ගියේ කුමකටද?

(ලකුණු 1 × 3 = 3)

**(මුළු ලකුණු 10)**

(05) පහත සඳහන් පද වල තේරුම ලියන්න

1) පුරාණෝක්ති
2) ආචීර්ණ කල්පිත
3) මාර්ගෝපදේශය
4) පරිශීලනය
5) නොනගතය

(ලකුණු 2 × 5 = 10)

(06) පහත සඳහන් පද්‍යයෙහි ඉතිරි කොටස සම්පූර්ණ කරන්න

මගේ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
.......................................................
....................................................... (ල.02)

1) ඉහත පද්‍යය ඇතුළත් පද්‍ය පන්තියේ නම කුමක්ද? (ල.02)
2) එය ලියූ කවියා නම් කරන්න. (ල.02)
3) කවියා විසින් ලියන ලද දේශාභිමාන කාව්‍ය නිර්මාණ දෙකක් හා ළමා කාව්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

(ල.04)

**(මුළු ලකුණු 10)**

(07) පහත සඳහන් ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

උත්තුංග ගුණයෙන් පිරිපුන් කුමාරතුංග මුනිදාස මහතා ශාස්ත්‍රීය විද්වතකු පමණක් නොව නිර්මාණශීලී ලේඛකයෙක් ද විය. ඔහු ලියූ ග්‍රන්ථ සම්භාරය අති විශාලයි. එම පොත් පෙරහරේ මුල්ම කෘතිය "සාමාන්‍ය දැනීම පිළිබඳ ප්‍රශ්න" නම් කෘතියයි. සිය බසෙහි ඕජෝ ගුණය මතු කරමින් ළමා අධ්‍යාපනය සඳහා අක්ෂර ශික්ෂාව, ශිෂ්ටාචාරය, කියවන නුවණ , ශික්ෂා මාර්ගය ආදී ග්‍රන්ථ ලියා ඇත. එමෙන්ම දරුවන්ට රසඥතාවයක් හා ජීවිතාවබෝධයක් ලබාදීමට හාවාගේ වග, නැලවිල්ල, උදය ආදී නිර්මාණ රචනා කර ඇත. දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහා ලියූ "රසායනය" නම් පොත් පෙළ ද සංගීතය සඳහා "හෙළ මියැසිය" කෘතියද ලිවීම ලේඛන දිවියේ වැදගත් අවස්ථාය. එමෙන්ම පියාගේ සෙවණින් ලැබූ නිර්මාණ කෞශල්‍යය "පියසමර" කෘතියෙන් මනාව පැහැදිලි කරයි. "අලුත් අලුත් දේ නොතනන ජාතිය ලොව නොනගී" යන කියමන එතුමාගේ වටිනා ආදර්ශ පාඨයකි.

1) කුමාරතුංග මුනිදාස මහතා ලියූ මුල්ම පොත කුමක්ද?
2) එතුමා ලියූ ළමා අධ්‍යාපන ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
3) කුඩා දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමට කුමාරතුංග මහතා ලියූ පොත් පෙළෙහි නම කුමක්ද?
4) කුමාරතුංග මහතාගේ "පියසමර" කෘතියෙන් විස්තර වන්නේ කුමක් ගැනද?
5) සර්වකාලීන අගයකින් යුත් කුමාරතුංග මහතාගේ වැදගත් ප්‍රකාශය ලියන්න.

**(ලකුණු 2 × 5 = 10)**

# පිළිතුරු



Answer

# පළමු වාර පරීක්ෂණය - 2019
# 8 ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍යය (පිළිතුරු පත්‍රය)
## I කොටස

(01) II (02) III (03) III (04) I (05) IV

(06) II (07) III (08) II (09) I (10) IV

(11) I. පැරණි කියමන්
II. උපන්දින උත්සවය

(12) I. ඇස, නයන, ........
II. දුප්පත්, දරිද්‍ර, ........

(13) I. අකීකරු
II. ආදායම

(14) I. උපමාව : පිච්ච පොකුරු
II. උපමේය : නංගිගේ පොඩි හිනාව

(15) I. කඳ II. පහන

(16) I. ළමයින් II. ගොවියකු

(17) II

(18) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න

(19) I. ගෙරවුම්
II. කඳහදල්

(20) I. විලිකුන්
II. අවරගිර

## II කොටස

(01) I. ගීතාංජලී
ii. බෙංගාලි ජාතිකයෙක්
iii. මුළ / පලා
iv. කැමෙන් / ජීවිතය
v. සුදුසු පරිදි ලකුණු දෙන්න.

(02) අන්තර්ගත කරුණු, ස්වීයත්වය හා ශීල්පීය දක්ෂතා යනාදි කරුණු මත ලකුණු දෙන්න. (ලකුණු 10)

(03) අදාළ කරුණු අනුව ලකුණු දෙන්න. (ලකුණු 10)

(04) i. නිවැරදි වචන සඳහා ලකුණු ලබාදෙන්න
ii. I. පරිගණකය
ii. කෘත්‍රිම
iii. කනිෂ්ඨ
iv. ගිජ්ඣකූට
v. ප්‍රතික්ෂේප
(ලකුණු 10)

(05) i. දවස උදාවීම / ඉර උදාවීම / උදෑසන ආරම්භ විම
ii. ඉරුගේ රැස්වලින් / ඉරුගේ රැස් දිළිසීමෙන්
iii. සුදු-රතු ඇඳුම් ඇඳගත් ළමයින්ට/ ළමයින්ට
iii. නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න
iv. ආ) සියපත - නෙළුම ආ) තුෂර - පිණි
v. ප්‍රතික්ෂේප
(ලකුණු 10)

(06) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

(07)

| පෙළපොතේ සඳහන් පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාහටද? | කීවේ කුමන අවස්ථාවේදීද |
|---|---|---|---|
| I. එතනහාමි | ඩිංගිරාල | එතනහාමිට | සාස්තරකාරයා බොරු කී විට |
| ii. අලුත් අවුරුදු උත්සවය | සීයා | මුණුබුරාට | අවුරුදු චාරිත්‍ර පිළිබඳ කතා කරන විට |
| iii. කතාබහට අවධානය | අම්මා | ඒජන්ත උන්නාන්සේට | පෙත්සම පිළිගැන්වූ අවස්ථාවේ |
| iv. කතාබහට අවධානය | ගුරුතුමා | මුදලිහාමිට | පාසලේදී |
| v. එනතහාමි | සාස්තරකාරයා | එතනහාමිට | සාස්තර බලන අවස්ථාවේ |

(ලකුණු 2x5=10)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය 2021 | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை 2021 | 02 மணி நேரம் |
| Diagnostic Test 2021 | 02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 08 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 08 |
| Sinhala Language and Literature | Grade 08 |

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. | i | 11. | iv |
| 2. | iv | 12. | i |
| 3. | iv | 13. | iv |
| 4. | i | 14. | iii |
| 5. | ii | 15. | ii |
| 6. | iii | 16. | ii |
| 7. | iii | 17. | i |
| 8. | iv | 18. | iii |
| 9. | iii | 19. | ii |
| 10. | i | 20. | ii |

## II පත්‍රය

1. i. ලිපි වර්ග

    දැන්වීම්

    පෝස්ටර්

    අත් පත්‍රිකා

ii. තොරතුරු හුවමාරු කරගැනීමට හැකි වීම

දැනුම ලබා ගැනීමට හැකිවීම

නිර්මාණ ශක්තිය වර්ධනය වීම

iii. ක්‍රමානුකූලව ලිවිය යුතුය

නිවැරදිව සකස් කළ යුතුය

නිවැරදි විරාම ලක්ෂණ යෙදිය යුතුය

iv. පුද්ගල මරණයකදී ජනයා දැනුවත් කිරීමේ දී

වෙළඳ දැන්වීමක් පිළිබඳ ජනයා දැනුවත් කිරීමේ දී

(ඩෙංගු උවදුර, කොරෝනා වසංගතය, පොලිතීන් භාවිතය, කසල කළමනාකරණය, පරිසර විනාශය ආදී කරුණුවලදී මහජනයා දැනුවත් කිරීම සඳහා)

v. දිනය

අරමුණ

වේලාව

ස්ථානය

2. සුදුසු පරිදි පිළිතුරු ලබා දෙන්න.

3. (අ)

I. එතනහාමි

II. ඩිංගි රාළ විසින් එතනහාමිට

(ආ)

I. ස්වාමිදුව විසින්

II. පියසේනට

(ඇ)

I. සැබෑ ලෙන්ගතුකම

II. නයිටින්ගේල්

(ඈ)

I. මහගමසේකර

II. පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව ඇතුළු පිරිස

(ඉ)

I. මනමේ නාට්‍යය

II. මනමේ කුමරිය

4.

| ජාති නාම | ද්‍රව්‍ය නාම | ගුණ නාම | සංඥා නාම |
|---|---|---|---|
| ඕලු | වැලි | මහලු | සම්පත් |
| හංසයා | ගල් | දක්ෂ | ලංකාව |
| මුගුණුවැන්න | වතුර | උස | දිනමිණ |
| රට කජු | පොත් | කෙට්ටු | ගුත්තිලය |
| කුරුල්ලා | පැන්සල | කරුණාවන්ත | සබරගමුව |

5.

I. යයි / ගියේ ය

II. කරති / කළහ / කළෝ ය

III. කළහ / කළෝ ය

IV. සුදුසු ස්ත්‍රී ලිංග ඒක වචන නාම පදයක්

V. සුදුසු පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග ඒක වචන නාම පදයක්

VI. සුදුසු පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග ඒක වචන නාම පදයක්

VII. බබලයි /දිලිසෙයි / බැබලෙති / දිලිසෙති / බැබලුණේ ය/ දිලිසුනේ ය

VIII. කරහු / කළහු

IX. අපි

6.

I. සද්ධර්මරත්නාවලිය

II. (අ) හතළිස් අටක්

(ආ) භාර්යාව

III. පුතකු ලැබීම

IV. දෙකයි (02), ගෙරි (හරක්) හා මසුරන්

V. දීඝලම්බික / ප්‍රතිලාභය

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3in1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ